**පීපල්ස් මයික්‍රෝ කොමර්ස් ලිමිටඩ් - 2023/2024**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

පීපල්ස් මයික්‍රෝ කොමර්ස් ලිමිටඩ් ("සමාගම ") හි 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරු වලින් සමන්විත 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදී.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා සමාගම විසින් පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොදු ලෙජර (GL) ගිණුම්, මූල්‍ය ප්‍රකාශන සටහන් සහ හෙළිදරව් කිරීම් සම්බන්ධයෙන් සමාගම සතුව හිමිකරුවන්ගේ ලේඛනගත ලැයිස්තුවක් නොමැත. | පොදු ලෙජර (GL) සහ සටහන් සඳහා වෙනම පිරිස් වෙන් කිරීම ඉදිරි මූල්‍ය වර්ෂය තුළ අවශ්‍ය කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සමඟ අනාගතයේදී සිදු කළ හැකිය. | සටහන් සහ හෙළිදරව් කිරීම් වල සකස් කරන්නා සහ අනුමත කරන්නාට අදාළ භාරකාරත්වය හඳුනා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගාල්ල ශාඛාව සඳහා කුලී ගිවිසුමක් නොමැත. | PIL සහ PML අතර නව ගිවිසුමක් සකස් කිරීමට කටයුතු කෙරේ. | කුලී ගිවිසුම ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |

## 1.6 තොරතුරු තාක්ෂණ පොදු පාලන ක්‍රම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| I. 2024 මාර්තු 31 දිනට සමාලෝචිත අවස්ථාවේදී ඉල්ලා අස් වූ සේවකයින්ගේ පරිශීලක ගිණුම් මයික්‍රොෆින් පද්ධතිවලින් නියමිත කාල රාමුව තුල අක්‍රිය කර නොතිබුණි. | පරිශීලක ගිණුම් අක්‍රිය කරන ලෙස මානව සම්පත් දෙපාර්තමේන්තුව ප්‍රවේශ ඒකකයට දැනුම් දී ඇත්තේ ප්‍රමාද වූ දිනකදීය. | ඉල්ලා අස් වූ/මාරු කරන ලද/විශ්‍රාමික සේවකයින්ගේ පරිශීලක ගිණුම් ව්‍යාපාරික දිනය අවසානයේ ඔවුන්ගේ ඉල්ලා අස්වීමේ/මාරුවීම්/විශ්‍රාම යන දිනවලදී අක්‍රිය කළ යුතුය. තවද, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි යාවත්කාලීන කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න. |
| II. පීපල්ස් මයික්‍රෝ කොමර්ස් ලිමිටඩ් හි ආපදා පිළියම් සැලැස්ම 2022 ජනවාරි 27 න් පසු සමාලෝචනය කර නොතිබුණි. | 2022 අංක 01 දරන CBSL මඟපෙන්වීම ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියක IS ඒකකය යෙදී සිටි අතර, ඔවුන් ආපදා පිළියම් සැලැස්ම සංශෝධනය කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටී. | |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය බදු පෙර ලාභය රු. 186,155,736 ක් වූ අතර පෙර වසරේ අනුරූප ලාභය රු. 67,050,781 කි. ඒ අනුව, මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 119,104,955 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පොළී ආදායම රු. 120,566,762 කින් ඉහළ යාම සහ පොලී වියදම් රු. 126,228,492 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

**2.2.1 සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ හතරක සමාගමේ මූල්‍ය ප්‍රතිඵලවල සාරාංශයක් පහත වගුවේ දැක්වේ.**

| වර්ෂය | 2023/2024 | 2022/2023 | 2021/2022 | 2020/2021 | 2019/2020 |
|---|---|---|---|---|---|
| පොලී ආදායම (රු.) | 885,647,924 | 765,081,162 | 793,186,355 | 819,027,057 | 795,054,678 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම / (අඩුවීම) (%) | 15.76 | (3.54) | (3.16) | 3.02 | - |
| පොලී වියදම්(රු.) | 388,057,922 | 514,286,414 | 184,907,941 | 218,015,318 | 265,159,407 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම / (අඩුවීම) (%) | (24.54) | 178.13 | (15.19) | (17.78) | - |
| බදු පෙර ලාභය (රු.) | 186,155,736 | 67,050,781 | 276,623,242 | 202,056,281 | 48,974,530 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩිවීම / (අඩුවීම) (%) | 177.63 | (75.76) | 36.90 | 312.57 | - |

**2.2.2** සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල විශ්ලේෂණයක් පසුගිය වර්ෂය සමඟ සසඳා ,වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතයන් සහිතව පහත වගුවේ දැක්වේ.

| විස්තරය | විචලනය වැඩිවීම / (අඩු වීම) (රු.) | විචලනය % | විචලනය සඳහා හේතුව |
|---|---|---|---|
| පොලී ආදායම් | 120,566,762 | 15.76 | 2022/23 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 2023/24 මූල්‍ය වර්ෂය සඳහා ප්‍රදානය කිරීම් (මුදාහැරීම්) සියයට 142 කින් වැඩි වී ඇත. |
| පොලී වියදම | (126,228,492) | (24.54) | සියලුම PML ණය ගැනීම් විචල්‍ය අනුපාත යටතේ වේ. 2023/24 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව 2022/23 මූල්‍ය වර්ෂය තුළ වෙළෙඳපොළ පොලී අනුපාත ඉහළ අගයක් වේ. මේ හේතුවෙන් 2023/24 මූල්‍ය වර්ෂයේදී පසුගිය මූල්‍ය වර්ෂයට සාපේක්ෂව පොලී වියදම් අඩු මට්ටමක පැවතුණි. |
| ණය හා ලැබිය යුතු දෑ සඳහා හානිකරණ වියදම | (47,813,917) | (42.35) | ආර්ථික සාධක ගැලපීම සහ පැහැර හැරීමේ සම්භාවිතාවන් පෙර වසර අවසානයට සාපේක්ෂව හානිකරණ ප්‍රතිපාදන අඩුවීමට බලපා ඇත. |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 47,314,429 | 41.40 | ප්‍රදානය කිරීමේ මට්ටම් (මුදාහැරීම්) ඉහළ යාම හේතුවෙන් අදාළ වියදම් සමාන්තරව ඉහළ ගොස් ඇත. |
| ගාස්තු හා කොමිස් ආදායම් | 27,314,602 | 108.40 | ප්‍රදානය කිරීමේ මට්ටම් (මුදාහැරීම්) ඉහළ යාම හේතුවෙන් අදාළ ගාස්තු සහ කොමිස් ආදායම ද සමාන්තරව ඉහළ ගොස් ඇත. |

**2.3 අනුපාත විශ්ලේෂණය**

ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ සමාගමේ වැදගත් අනුපාත පහත වගුවේ දැක්වේ.

| විස්තරය | 2023/2024 | 2022/2023 |
|---|---|---|
| ශුද්ධ ලාභ අනුපාතය | 11.83% | 8.48% |
| හිමිකම මත ප්‍රතිලාභය (ROE) | 17.82% | 13.08% |
| වත්කම් මත ප්‍රතිලාභය (ROA) | 3.77% | 2.54% |
| ණය හිමිකමට අනුපාතය | 3.72 | 4.14 |